**ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය - 2016**

**-------------------------------------------------------------------------------**

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**,** ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 199**0** අංක **20** දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතේ **56(2)** වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000-1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

**-------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැළපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**2.1 මතය ව්‍යාවනය**

**---------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

------------------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 47 ඡේදය අනුව දේපල පිරියත හා උපකරණවල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම සඳහා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සිදුකළ යුතු වුවත් 2016 දෙසැම්බර් 31 දින වන විට ගිණුම් අනුව සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් භාවිතයේ පවතින පිරිවැය රු. 48,765,742 ක් වටිනා මෝටර් රථ 23 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. තවද ගිණුම් ප්‍රමිතය අනුව නිතර ධාරණ අගය හා වෙළඳපොල අගය / සාධාරණ අගය වෙනස් නොවන දේපල පිරියත හා උපකරණ වසර 03 කට හෝ 05 කට වරක් සම්පූර්ණ වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කිරීම කළ යුතු වුවත් අධිකාරිය සතු පිරිවැය රු. 3,136,974,578 ක් වූ ඉඩම්, ගොඩනැගිලි, කාර්යාල උපකරණ හා පුහුණු උපකරණ යන ස්ථාවර වත්කම් සම්බන්ධ සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් ගිණුම් තැබීම සඳහා 'ටැලි' නැමති ගිණුම්කරණ පැකේජය භාවිතා කර තිබුණද මූල්‍ය ප්‍රකාශන අතින් (Manual) සකස් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(i)** සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට පදනම් කරගෙන තිබූ, විගණනයට ඉදිරිපත් කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ ශේෂ පිරික්සුම තුල රු. 539,276,533 ක් වූ බැර ශේෂයක් ලාභ/අලාභ ගිණුම ලෙස දක්වා තිබුණු අතර එම ශේෂය පරිගණකගත ගිණුම්කරණ පද්ධතිය තුළින් ජනනය වූ 2016 ජනවාරි 01 දිනට සමුච්චිත ලාභය බව නිරීක්ෂණය විය. එහෙත් මූල්‍ය ප්‍රකාශන අනුව එදිනම සත්‍ය සමුච්චිත අලාභය රු. 658,416,397 ක් විය. මෙම පරිගණකගත ගිණුම්කරණ පද්ධතිය 2011 වර්ෂයේ ආරම්භ කර තිබූ නමුත් වාර්ෂිකව අවශ්‍ය ජර්නල් සටහන් මඟින් සමුච්චිත ලාභ / අලාභ ගිණුම යාවත්කාලීන කර නොතිබූ බවත් ගිණුම් කාණ්ඩ ( GROUP ) වැරදි ලෙස හඳුනා ගෙන ගිණුම් තැබීම හේතුවෙන් මෙම ශේෂ අතර රු. 1,197,692,930 ක වෙනස්කම් සිදුව තිබූ බව පරිගණකගත ගිණුම්කරණ පද්ධතිය පිළිබඳ කරන ලද පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද ඉහත වෙනස්කම් නිවැරදි කිරීම සඳහා පිළිගත හැකි විස්තරාත්මක ජර්නල් සටහන් හා අදාල සැසඳීම් ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට අධිකාරිය අපොහොසත් විය.

**(ii)** ලෙජරය අනුව සංචිත හා අර්ධකාලීන පාඨමාලා ලාභ/අලාභ ගිණුමේ බැර ශේෂය රු.48,342,934 ක් වූ අතර හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය අනුව එම ශේෂය රු.54,812,789 ක් වූයෙන් රු.6,469,855 ක වෙනසක් නිරීක්ෂණය විය.

**(iii)** ලෙජරය අනුව ආරම්භක තොග ශේෂය රු.10,528,029 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.9,221,117 ක් වූයෙන් රු.1,306,912 ක වෙනසක් නිරීක්ෂණය විය.

**(iv)** මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා යොදා නොගත් පහත සඳහන් රු. 1,425,589,071 ක් වූ හර ශේෂ හා රු. 760,826,645 ක් වූ බැර ශේෂ, ශේෂ පිරික්සුමෙහි ඇතුළත් වී තිබුණි.

| ගිණුම් විෂයය | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|
| අර්ධකාලීන පාඨමාලා දේශන ගාස්තු | 92,000 | |
| අර්ධකාලීන පාඨමාලා ආදායම | | 3,162,000 |
| මුද්‍රණ අංශයේ සහ අර්ධකාලීන පාඨමාලා දේශන ගාස්තු | 989,600 | |
| රජයේ අරමුදල මාරු කිරීමේ ගිණුම | 1,120,312,313 | |
| ලාභලාභ ගිණුම | | 539,276,533 |
| නිපුණතා ආංශික සංවර්ධන අරමුදල | | 218,388,112 |
| සංචිත හා අතිරික්ත (සමුච්චිත ඉපයීම්) | 304,195,158 | |
| | ------------------ | ---------------- |
| එකතුව | 1,425,589,071 | 760,826,645 |
| | ========== | ========= |

**(v)** පහත සඳහන් ශේෂ ශේෂ පිරික්සුමට ඇතුළත්ව නොතිබුණි.

| ගිණුම් විෂයය | ශේෂය<br>රු. |
|---|---|
| බුදු මැදුර අරමුදල | **719**,866 |
| යෞවන කටයුතු අමාත්‍යාංශය (**MYASD Grant**) | 63,800,000 |

ඉහත සඳහන් ශේෂ සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවලට සිදුවන බලපෑම් පිළිබඳව නිවැරදි සාක්ෂි ඉදිරිපත් කිරීමට අධිකාරිය කටයුතු නොකරන ලදී. මේ නිසා මෙම ශේෂ තුළ වංචා හෝ වැරදි හේතුවෙන් සිදු වූ බලපෑම්ද නොමැති බව තහවුරු කරගත නොහැකි විය.

(ආ) රඳවාගත් ඉපයීමට ගැලපිය යුතු පසුගිය වර්ෂ සඳහා වූ රු. 28,721,375 ක් වූ පාරිතෝෂික අධිවෙන්කිරීම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපීම නිසා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි.

(ඇ) 2016 වර්ෂයට අදාළ රු. 6,368,353 ක් වූ උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය තුළ දක්වා තිබූ රු. 657,173,475 ක් වූ සමුච්චිත අරමුදල් ශේෂය තුළ රු. 1,123,161 ක් වූ අවිනිශ්චිත හර ශේෂයක් ඇතුළත් කර තිබුණි.

(ඉ) බැංකු ගිණුම් 06 කට අදාල රු. 139,565 ක සෘජු හර කිරීම් හා බැංකු ගිණුම් 05 කට අදාල රු. 3,735,397 ක සෘජු බැර කිරීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී කරන ලද කොන්ත්‍රාත් 02 ක් වෙනුවෙන් ගෙවා තිබූ රු.2,151,623 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම්, අත්තිකාරම් ලෙස ගිණුම්ගත නොකර කෙරීගෙන යන වැඩ ගිණුමට ඇතුළත් කර තිබුණි.

(උ) කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් රු.7,033,216 ක් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ කොටසක් නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ වූ අතර එහි වැඩ අවසන් කර 2014 නොවැම්බර් 12 දින භාර දී තිබුණි. එසේ වුවද රු.8,458,390 ක් වූ කළ වැඩ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. ගෙවිය යුතු ඉතිරි මුදල් වූ රු.1,649,913 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදනද සලසා නොතිබුණු අතර එම අමතර වැඩ සඳහා විධිමත් අනුමැතියක්ද ලබාගෙන නොතිබුණි.

(ඖ) 2011 වර්ෂයට පෙර භාණ්ඩාගාර නොවන වෙනත් ප්‍රාග්ධන ආධාර වශයෙන් අධිකාරියට ලැබී තිබූ රු. 717,117,965 ක් මූල්‍ය ප්‍රකාශන තුළ වෙනත් ආධාර සංචිත ලෙස දක්වා තිබූ අතර මේ පිළිබඳව ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(එ) 2016 දෙසැම්බර් 31 දිනට ලෙජරය අනුව රු.1,064,076,577 ක් වූ විලම්භිත ප්‍රදාන ශේෂය (**Differed Income**), වර්ගීකරණය කර හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි.

(ඒ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ රු. 864,845,549 ක් වූ සංචිත ශේෂයේ ස්වභාවය, අරමුණ යනාදී විස්තර ගිණුම් සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ඔ) හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනයේ භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් වෙනම දක්වා නොතිබුණු අතර එය සමුච්චිත ලාභාලාභ ගිණුම මඟින් ගලපා තිබුණි.

(ඕ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

**(i)** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී මුදල්මය නොවන ගැලපීම් මෙහෙයුම් ලාභයට එකතු කළ යුතු වුවද වර්ෂය තුළ රු.9,446,442 ක් වූ වාහන විකුණුම් ලාභය එසේ ගැලපීම් කර නොතිබුණි.

**(ii)** සමාලෝචිත වර්ෂය තුළ වාහන විකිණීමෙන් රු. 9,446,442 ක් ලැබී තිබුණද එය රු. 7,935,524 ක් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

**(iii)** සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ රු. 9,446,442 ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වා තිබූ බැංකු ගිණුමකට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් ශේෂය රු.2,720,137 ක් වුවද මුදල් පොත අනුව එම ශේෂය රු.920,137ක් ලෙස දක්වා තිබීම නිසා ශේෂය රු.1,800,000 ක වෙනසක්ද, මූල්‍ය ප්‍රකාශන අනුව තවත් බැංකු ගිණුම් 03 ක එකතුව රු.165,657 ක් වූ මුදල් ශේෂය මුදල් පොත අනුව රු. 887,727 ක් වූයෙන් රු.722,070 වෙනසක් විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 67,993,683 ක් වූ ණයගැති ශේෂයෙන් 2017 ඔක්තෝබර් 22 දිනට පැවති ණයගැති ශේෂය රු. 37,700,843 ක් විය. එයින් වර්ෂ 05 ඉක්ම වූ රු. 4,176,388 ක් වූ ණයගැති ශේෂ 38ක් ද, වර්ෂ 03 ත් වර්ෂ 05 ත් අතර රු. 260,436 ක් වූ ණයගැති ශේෂ 02 ක් ද, වර්ෂ 01 ත් වර්ෂ 03 ත් අතර රු. 33,264,019 ක් වූ ණයගැති ශේෂ 20 ක්ද වූ අතර එම ණය අයකර ගැනීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ආ) 1995 වර්ෂයේ සිට 2015 වර්ෂය අතර කාලය තුළදී අධිකාරිය විසින් විවිධ කටයුතු වෙනුවෙන් ලබාදී තිබූ එකතු වටිනාකම රු.4,034,856 ක් වූ අත්තිකාරම් ශේෂ 38 ක් 2017 ඔක්තෝබර් 22 දින වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙයින් රු.767,476 ක් අධිකාරියේ අභ්‍යන්තර නිළධාරීන් වෙත ලබාදී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 30,963,906 ක් වූ ණයහිමි ශේෂයෙන් වර්ෂ 05 ඉක්ම වූ රු.300,455 ක් වූ ණයහිමි ශේෂ 8 ක් ද, වසර 03 ත් වසර 05 ත් අතර වූ රු.1,962,183 ක් වූ ශේෂ 02 ක් ද, වසර 2 කට වැඩි රු. 46,045 ක ශේෂයක්ද **2017** ඔක්තෝබර් 22 දින වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි.

(ඈ) විවිධ ණයගැති ශේෂය තුළ 2017 ඔක්තෝබර් 22 දිනට නිරවුල් නොකළ අභ්‍යන්තර ගනුදෙනු මත වූ ශේෂය රු.2,629,477 ක් වූ අතර ණයහිමි ශේෂය තුල අන්තර්ගත අභ්‍යන්තර ගනුදෙනු මත වූ ශේෂය රු.3,288,989 ක් විය. මෙම අභ්‍යන්තර ගනුදෙනු මත ණයගැති හා ණයහිමි ශේෂ අතර වර්ෂ 5 ඉක්මවූ නිරවුල් කර නොගත් රු.755,594 ක් වූ ශේෂ 12 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය රු. 46,454,751 ක් වූ අතර ඒ තුළ ආධුනිකයන්ගෙන් අයකර තිබූ රු.5,000 බැගින් වූ තැන්පතුවලින් දීර්ඝ කාලයක සිට ආපසු නොගෙවූ වටිනාකම රු. 27,448,816 ක් විය. එම තැන්පතු නිරවුල් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණු අතර එම තැන්පතුවලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 37,427,985 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද රු.6,000,000 ක් වූ ආයෝජනයන් වෙනුවෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ **IX** පරිච්ඡේදයේ 2.2 වගන්තිය | අධිකාරියේ අර්ධ කාලීන පාඨමාලාවල දේශන ගාස්තු මත අයකළ යුතු රාජ්‍ය භාගය අයකර ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| **(i)** මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 02 කට හා පෙර වර්ෂවල සිදු වූ වාහන අනතුරුවලට අදාලව සිදු වූ අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| **(ii)** මුදල් රෙගුලාසි 396 (ඇ) | | නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්ම වූ එකතුව රු.59,578 ක් වූ චෙක්පත් 21 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/ 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | **(i)** | මහා භාණ්ඩාගාරයේ අනුමැතියෙන් තොරව මධ්‍යම අරමුදල නමින් අරමුදලක් **(Central Fund)** පිහිටුවා තිබූ අතර 2016 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු.54,812,788 ක් විය. 2013 වර්ෂයේ සිට මෙම අරමුදලට අර්ධකාලීන පාඨමාලා පැවැත්වීමේ සහ මුද්‍රණ අංශය ක්‍රියාත්මක කිරීමේ ලාභයෙන් සියයට 40 බැගින් ද ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. |
| | **(ii)** | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධිකාරිය තුල පුස්තකාල අරමුදල, කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ මායිම් තාප්පය බිඳ දැමීමේ අරමුදල, බුදුමැදුර අරමුදල, මෝටර් සයිකල් චක්‍රීය අරමුදල, අර්ධකාලීන පාඨමාලා සඳහා ප්‍රාග්ධන සංචිතය හා අර්ධකාලීන පාඨමාලා වගවීම් අරමුදල යනුවෙන් අරමුදල් 6 ක් පිහිටුවා තිබුණි. මධ්‍යම අරමුදලට අමතරව 2016 දෙසැම්බර් 31 දිනට මෙම අරමුදල්වල පැවති ශේෂයන්හි එකතුව රු. 25,632,764 ක් විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.21,878,483 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.84,748,374 ක් වීමෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.106,626,857 ක වර්ධනයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව නිපුණතා ආංශික ව්‍යාපෘති ප්‍රදාන රු. 47,192,637 කින් අඩු වී තිබුණද, භාණ්ඩාගාර ප්‍රදාන රු. 83,000,000 කින් හා වෙනත් ආදායම් රු. 33,092,182 කින් වැඩිවීම හා පුද්ගලික පඩිනඩි රු. 36,753,773 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල සමාලෝචනය කිරීමේ දී අධිකාරියේ ඉකුත් වර්ෂ 4 හි මූල්‍ය ප්‍රතිඵලය අඛණ්ඩව ඌනතාවයන් පැවති අතර 2015 වර්ෂයේ දී රු. 84,748,374 ක් වූ ඌනතාවය සමාලෝචිත වර්ෂයේදී රු. 21,878,483 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය ගැලපීමෙන් පසු 2012 වර්ෂයේ රු.376,323,732 ක් වූ අධිකාරියේ දායකත්වය සමාලෝචිත වර්ෂය වන විට රු. 654,504,693 ක් දක්වා අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**3.2 අධිකාරියට එරෙහිව හෝ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩ තහනම් කරන ලද නිලධාරීන් දෙදෙනෙකු විසින් අධිකාරියට එරෙහිව කම්කරු විනිශ්චය සභාවේ පවරන ලද නඩු 02 ක් විභාග වෙමින් පවතී.

(ආ) අධිකාරියට අයත් වැල්ලවත්ත පුහුණු මධ්‍යස්ථානයට අයුතු ඇතුලුවීම හා අනර්ථය සිදුකිරීම සම්බන්ධයෙන් වැල්ලවත්ත පොලිසිය විසින් බාහිර පාර්ශවයකට එරෙහිව නඩුවක් පවරා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතේ අංක 37 (1) දරන ඡේදය අනුව අධිකාරියේ අරමුණු පහත පරිදි වේ.

**(i)** වෘත්තීය පුහුණු සැලසුම් කිරීම හා ලබාදීම, පුහුණු සම්මතයන් නිශ්චය කිරීම, විභාග පැවැත්වීම හා සහතිකපත්‍ර නිකුත් කිරීම,

**(ii)** වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් කිරීම, තරඟ පැවැත්වීම, පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම සහ සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි ආයතන සමඟ සම්බන්ධකම් ඇති සහතික, ඩිප්ලෝමා සහ උපාධි සමතත්වයෙහිලා සැලකීම සඳහා අදාල කටයුතු කිරීම සහ බලාත්මක කිරීම.

(ආ) ඉහත (අ) හි සඳහන් අරමුණු අතරින් වෘත්තීය පුහුණුව සම්බන්ධයෙන් පර්යේෂණ හා සංවර්ධනයන් සිදු කිරීම, තරඟ පැවැත්වීම සහ සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි ආයතන සමඟ සම්බන්ධකම් ඇති සහතික ඩිප්ලෝමා සහ උපාධි සමතත්වයෙහි ලා සැලකීමට අදාල කටයුතු කිරීම හා බලාත්මක කිරීම යන අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි අධිකාරිය අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් සඳහා නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදලින් වෙන්කර තිබූ මුදල් ප්‍රමාණය රු. මිලියන 119.7 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දිනට වැයකර තිබූ මුදල රු. මිලියන 65.27 ක් හෙවත් සියයට 55 ක් වී තිබුණි.

(ඈ) අධිකාරිය විසින් 2016 වර්ෂය සඳහා පිළියෙල කර අනුමත කර ගෙන තිබූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන්හි වර්ෂය අවසානයට මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඇතුලත් කාර්යසාධන වාර්තාවක් සකස් කර නොතිබුණි. 2015 හා 2014 විගණන වාර්තා මගින්ද මේ පිළිබඳ වාර්තා කර තිබූ නමුදු ආයතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ද එම වාර්තා සකස් කර නොතිබුණි.

(ඉ) <u>ආධුනිකයන් බඳවාගැනීම හා පාඨමාලා හැර යාම්</u>

**(i)** දිස්ත්‍රික් මට්ටමින් ආධුනික බඳවාගැනීම් සැලකිල්ලට ගැනීමේදී 2016 වර්ෂය තුළ වැඩිම ආධුනික බඳවාගැනීම් පිළිවෙලින් කොළඹ හා හම්බන්තොට දිස්ත්‍රික්කවල සිදුවී තිබූ අතර එම ප්‍රමාණ පිළිවෙලින් 3,678 ක් හා 2,489 ක් වී තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් මට්ටමින් බඳවාගත් 29,694 ට ප්‍රතිශතයක් ලෙස එම දිස්ත්‍රික්ක දෙකෙහිම බඳවා ගැනීම් සියයට 21ක්

වී තිබුණි. දිස්ත්‍රික් මට්ටමින් අවම බඳවා ගැනීම් පිළිවෙලින් නුවරඑළිය , මොණරාගල හා මන්නාරම දිස්ත්‍රික්ක වලින් සිදුවී තිබූ අතර එම ප්‍රමාණ පිළිවෙලින් 596 , 617 හා 657 ක් හෙවත් සියයට 6 ක් තරම් අඩු මට්ටමක පවතින බව පුහුණු අංශයේ තොරතුරු අනුව නිරීක්ෂණය වුවද එම බඳවා ගැනීම් වැඩි කර ගැනීමට අවශ්‍ය පියවර අධිකාරිය විසින් ගෙන නොතිබුණි.

**(ii)** කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව යටතේ කර්මාන්ත ශිල්පී හා ස්ථානුරූපී පුහුණු පාඨමාලාවල වර්ෂය තුලදී පාඨමාලා හැරයාම පිළිවෙලින් සියයට 40 ක් හා සියයට 58 ක්ද මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව යටතේ පූර්ණකාලීන පාඨමාලා තුළ පාඨමාලා හැරයාම් සියයට 33 ක් ද තරම් ඉහළ මට්ටමක පැවතුණි. මෙම පාඨමාලා හැරයාම් අවම කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු අධිකාරිය විසින් සිදුකර නොතිබුණි.

**(iii)** සමාලෝචිත වර්ෂයේ අම්පාර දිස්ත්‍රික්කයේ පූර්ණකාලීන පාඨමාලා 02 කට අයත් වැඩසටහන් 05 ක් පවත්වා තිබූ අතර ආධුනික ධාරිතාවය 360 ක් වී තිබුණි. එහෙත් බඳවාගෙන තිබූ ආධුනික සංඛ්‍යාව 187 ක් වූ අතර ඉන් සියයට 25 ක් එනම් 46 දෙනෙකු පාඨමාලා හැරගොස් තිබුණි.ඒ අනුව පාඨමාලා සම්පූර්ණ කර තිබූ සංඛ්‍යාව ආධුනික ධාරිතාවයෙන් සියයට 35 ක් පමණක් බවත් ඌන උපයෝජන ධාරිතාවය සියයට 65 ක් බවත් නිරීක්ෂණය විය.

**(iv)** පොතුවිල් ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානයේ මහන මැෂින් ක්‍රියාකරු පාඨමාලාව සඳහා ආධුනික ධාරිතාවය 80 ක් ලෙස හඳුනාගෙන තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ ආධුනික බඳවා ගැනීම් 42 ක් වී තිබුණි. ඒ අනුව සියයට 47 ක ප්‍රමාණයක් බඳවා ගැනීමට කටයුතු කර නොතිබූ අතර පාඨමාලා හැරයාම් සංඛ්‍යාව 27 ක් හෙවත් සියයට 64 ක් වී තිබුණි.

**(v)** සමන්තුරේ හා කල්මුණේ මහන මැෂින් ක්‍රියාකරු පාඨමාලාව සඳහා පවතින ධාරිතාවයට සාපේක්ෂව ආධුනික බඳවා ගැනීම් ප්‍රමාණය සියයට 26 කටත් වඩා අඩු මට්ටමක පැවතුණි.

(ඊ) <u>පාඨමාලා ආරම්භ නොකිරීම</u>

2016 වර්ෂයේ මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව යටතේ සැලසුම් කළ පූර්ණ කාලීන පාඨමාලා 10 ක් හා අර්ධකාලීන පාඨමාලා 03 ක් පැවැත්වීමට අධිකාරිය කටයුතු කර නොතිබූ අතර එම පාඨමාලාවලට අයත් පුහුණු උපකරණද නිශ්කාර්යව පැවතුණි.

**(උ)** <u>**ප්‍රමාණවත් ආධුනික සංඛ්‍යාවක් නොමැතිව පාඨමාලා පැවැත්වීම**</u>

අවම ආධුනික සංඛ්‍යාව 10 ක් නොමැතිව පාඨමාලා පවත්වාගෙන යනු ලබන අවස්ථා 09 ක් නිරීක්ෂණය වූ අතර ප්‍රමාණවත් ආධුනිකයින් සංඛ්‍යාවක් සහිතව පාඨමාලා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

**(ඌ)** <u>ජාතික ආයතන වල ප්‍රගතිය</u>

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය තුළ ජාතික මට්ටමේ ආයතන 04 ක් 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල ජාතික ආයතන සඳහා බඳවා ගැනීමට ඉලක්ක කර තිබූ ආධුනික සංඛ්‍යාව 1,535 ක් වී තිබූ අතර බඳවා ගැනීම් 1,373 ක් වී තිබුණි. පාඨමාලා හැරයාම් සංඛ්‍යාව 139 ක් වූ අතර බඳවා ගැනීම්වල ප්‍රතිශතයක් ලෙස එම ප්‍රමාණය සියයට 10 ක් වේ. සභාපතිවරයාගේ පිළිතුර අනුව ජලනල ශිල්පී, දැව කාර්මික හා යන්ත්‍රකරු යන ක්ෂේත්‍ර වල පුහුණු ශිල්පීන්ගේ දැඩි ඉල්ලුමක් පැවතියද ශිෂ්‍ය අයදුම්පත් ප්‍රමාණය අඩු නිසා බඳවා ගැනීම් අඩුවී තිබුණි.

(එ) <u>ඉදිකිරීම් හා පුනරුත්ථාපන කටයුතු</u>

(i) අධිකාරියේ හැව්ලොක් ටවුන් ගොඩනැගිල්ලේ රැස්වීම් පැවැත්වීම සඳහා අංගසම්පූර්ණ රැස්වීම් ශාලාවක් සකස් කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2 ක් වෙන්කර තිබූ නමුත් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ කාර්යය සිදුකර නොතිබුණි.

(ii) 2016 වර්ෂයේදී පුහුණු මධ්‍යස්ථාන 05 ක පුනරුත්ථාපන කටයුතු සිදුකිරීම සඳහා රු.මිලියන 36.34 ක් වෙන්කර තිබුණි. ඉන් බදුල්ල පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන්කර නොතිබූ අතර මහනුවර පුහුණු මධ්‍යස්ථානයේ සිදුකිරීමට සැලසුම්කළ ඉදිකිරීම් කාර්යයේ ප්‍රසම්පාදන කටයුතු නිම නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 20.41 ක් ඌන උපයෝජිතව පැවතුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) (i) අධිකාරිය යටතේ පවත්නා කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ පාඨමාලා 8 ක් සඳහා 2016 වර්ෂයේ ආධුනිකයන් බඳවා ගැනීමේදී එහි මෙහෙයුම් කාර්ය පටිපාටියට හා පිළිගතහැකි ක්‍රමවේදයන්ට පටහැනිව අයදුම්පත් කැඳවීමේ කාලය දීර්ඝ කිරීම, අවම සුදුසුකම් නොලැබූවන් ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවීම හා පිළිතුරු පත්‍රවල ලකුණු වෙනස් කිරීම් ආදී අක්‍රමිකතා සිදුකර තිබුණි.

(ii) දෙවන වර සම්මුඛ පරීක්ෂණ සඳහා ලකුණු අනුපිළිවෙළින් බැහැරව පහළ ලකුණු ලබා තිබූ අපේක්ෂකයින් 29 දෙනෙකු අවිධිමත් ලෙස කැඳවා බඳවා ගෙන එයින් 26 දෙනෙකුට ඉහළ ලකුණු මත බඳවාගන්නා පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථාව ලබා දී තිබුණි.

(iii) ජාතික ආයතන මෙහෙයුම් පටිපාටිය පරිදි සම්මුඛ පරීක්ෂණ සඳහා බාහිර නිලධාරියෙකු සහභාගි කරගත යුතු වුවද කිසිදු බාහිර නිලධාරියෙකු සහභාගි කරවාගෙන නොතිබුණි. තවද සහතිකපත් පරීක්ෂාව සඳහා සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී තිබූ පරිපාලන නිලධාරිනිය අදාල ලේඛනවලට අත්සන් යොදා නොතිබූ අතර සහභාගි නොවූ අයෙකු ඒ සඳහා අත්සන් කර තිබුණි.

(ආ) කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු පාඨමාලාවල විෂයමාලාවලට අවශ්‍ය කාලීන සංශෝධන සිදු කිරීම සඳහා අධිකාරිය විසින් පෞද්ගලික සමාගමක් සමඟ 2014 මැයි මාසයේදී රු. 3,231,500 ක වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබුණි. 2014 සැප්තැම්බර් 24 දින ගිවිසුම්ගත කාර්යය අවසන් කළ යුතුව තිබූ අතර ඒ සඳහා 2014 වර්ෂයේ දී රු. 1,809,640 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණි. නමුත් 2017 ජුනි 18 දින වනවිට වසර 03 ක පමණ කාලයක් ගතවී තිබුණත් අදාළ කාර්යය සිදු නොකර අත්හැර දමා තිබුණි. අත්තිකාරම් මුදල් ගෙවීම වෙනුවෙන් ලබා දී තිබූ රු. 723,856 ක බැංකු ඇපකරය 2014 ජූලි 31 දිනෙන් අවසන් වී තිබූ අතර ගෙවන ලද අත්තිකාරම් මුදල්ද අයකර ගැනීමේ අවස්ථාවද අහිමිවීමෙන් ලබා දෙන ලද මුළු අත්තිකාරම් මුදලම අධිකාරියට පාඩුවක් බවට පත්වී තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෘත්තීය නිපුණතා සහතික නොමැතිව දැනටමත් වෘත්තීයන්හි නියැලෙන පුද්ගලයන්ට පෙර දැනුම පදනම් කරගත් ඇගයීම් ක්‍රමය (**RPL**) යටතේ නිපුණතා මට්ටම් ඇගයීම් කර 2017 වර්ෂයට ජාතික නිපුණතා සහතික පත්‍ර (**NVQ**) ලබාදීම සඳහා අයදුම්පත් කැඳවීමට නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය විසින් සපයන ලද අරමුදල් මගින් 2016 දෙසැම්බර් 25 දින රු. 4,942,700 ක් ගෙවා පුවත්පත් දැන්වීමක්, පුවත්පත් 10 ක පළකර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම තුළ නොවූ මෙම කාර්යය සඳහා වූ මෙම ප්‍රචාරණ වියදම දැරීම සඳහා විධිමත් අනුමැතීන් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මධ්‍යස්ථාන තුළ උපකරණ හා ඉන්වෙන්ට්‍රි තොග 71 ක ඌනතාවයක් වූ අතර ප්‍රධාන කාර්යාලයේ කාර්යස්ථ පුහුණු අංශයේ භෞතිකව පැවති ඉන්වෙන්ට්‍රි තොග අයිතම 62 ක් තොග පොතට ඇතුළත් කර නොතිබුණි.

## 4.4 දෘෂ්‍ය අක්‍රමිකතා

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් රාජසන්තක කරන ලද ධාවනයට සුදුසු තත්ත්වයේ නොවූ ටොයෝටා කොරෝනා වර්ගයේ වාහනය 2010 වර්ෂයේ දී රු. 1,134,000 ක් වූ වටිනාකමට අධිකාරිය විසින් මිලදී ගෙන තිබුණි. එසේ වුවද එම වාහනය අධිකාරිය විසින් ලියාපදිංචිකර නොතිබූ අතර පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උපදෙස් මත 2016 නොවැම්බර් 29 දින එහි එන්ජිම පුහුණු කටයුතු සඳහා කිලිනොච්චිය ජර්මානු පුහුණු ආයතනය වෙත ලබා දී තිබුණි. එම රථයේ ධාවන තත්ත්වය සම්බන්ධයෙන් පවත්වන ලද මූලික විමර්ශන වාර්තාව අනුව නිසි පරීක්ෂාවකින් තොරව මිලදී ගැනීම් කළ නිලධාරීන්ට හා මිලදී ගැනීමෙන් පසු අළුත්වැඩියා කිරීමට කඩිනම් පියවර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය පියවර ගැනීමට නිර්දේශ කර තිබුණ ද අදාල නිලධාරීන්ට විරුද්ධව විනය පියවර ගෙන නොතිබුණි.

## 4.5 අරමුදල් ඌන උපයෝජනය

2016 ජනවාරි 01 දිනට උපයෝජනය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන රු.33,389,693 ක් වූ අතර 2016 දෙසැම්බර් 31 දිනට එම ප්‍රමාණය රු.23,955,451 ක් වූයෙන් භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රග්ධන ප්‍රදාන ඌන උපයෝජිතව පැවතුණි.

## 4.6 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ දී කල්මුණේ ප්‍රාදේශීය ලේකම් විසින් අධිකාරියේ දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය වෙත ලබාදී තිබූ අක්කර 01ක් වූ ඉඩම 2016 සැප්තැම්බර් 30 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා පුහුණු මධ්‍යස්ථානය තුළ සහ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල පුහුණු මධ්‍යස්ථානය තුළ සාත්තු සේවක සහායක පාඨමාලාවට අදාළ පුහුණු උපකරණ අයිතම 56 ක් එම පාඨමාලා නොපැවැත්වීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි. තවද මුලතිව් දිස්ත්‍රික්කයේ 2016 වර්ෂයේ කිසිදු පුහුණු පාඨමාලාවක් පවත්වා නොතිබූ බැවින් එහි පුහුණු උපකරණ අයිතම 751 ක්ද නිෂ්කාර්යව පැවතුණි.

## 4.7 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදුන් අධිකාරියේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී **/12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 8.3.9 ඡේදය සහ 9.4 වගන්ති වල සඳහන් කරුණු වලට පටහැනිව අධිකාරියේ සම්පත් බාහිර ආයතනවලට මුදා හැර තිබූ අතර ඒ පිළිබඳ පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අධිකාරියේ සේවකයන් දෙදෙනෙකු රේඛීය අමාත්‍යංශයට හා හතර දෙනෙකු අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත 2015 දෙසැම්බර් 09 දින සිට මුදාහැර තිබූ අතර මුදාහල කාලය මාස 05 සිට මාස 18 දක්වා කාල පරාසයක විය. වෙනත් ආයතන වලට මුදා හැර තිබූ මෙම නිලධාරීන්ගේ වැටුප් එම අනුයුක්ත කරන ලද ආයතන වලින් ප්‍රතිපූරණය කර ගත යුතු වුවද රු. 824,087 ක වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරියේ සංචිත වාහනයක් කිසිදු ලිඛිත අනුමැතියක් හෝ නිදහස් කිරීමකින් තොරව 2016 අගෝස්තු 25 දින සිට නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යංශයේ අමාත්‍ය කාර්ය මණ්ඩලයේ භාවිතය සඳහා යොදවා තිබූ අතර එම වාහනයේ සේවා සහ අලුත්වැඩියා වෙනුවෙන් වර්ෂය තුළදී අධිකාරිය විසින් රු. 160,641 ක් වැයකර තිබුණි**.**

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය 1,358 ක් වූ අතර කොන්ත්‍රාත් පදනම මත සේවය කරන 46 දෙනෙකුද ඇතුළුව තථ්‍ය කාර්ය මණ්ඩලය 1,121 ක් විය. ඒ අනුව ස්ථිර පුරප්පාඩු සංඛ්‍යාව 283 ක් වූ අතර එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. කථිකාචාර්ය**,** පුහුණු නිලධාරී**,** උපදේශක හා පරීක්ෂක යන අධ්‍යයන කාණ්ඩයේ තනතුරු 198 ක් පුරප්පාඩුව පැවති අතර එය ආයතනයේ පුහුණු හා පරීක්ෂණ කටයුතු කෙරෙහි අහිතකර බලපෑමක් ඇතිකරන බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරියට ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු නොකර 2011 වර්ෂයේ සිට අධිකාරියේ ඉදිකිරීම් හා නඩත්තු අංශයේ සහ 2009 වර්ෂයේ සිට නඩත්තු කටයුතුවල රාජකාරී සඳහා පැවරුම් පදනම මත නිළධාරීන් දෙදෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ඇ) අධිකාරිය විසින් 2009 නොවැම්බර් 10 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ උපදෙස් ලිපියට පටහැනිව නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරට 2012 ජුලි 16 දින බඳවාගත් නිලධාරියාගේ ආරම්භක වැටුප් පියවර ලෙස රු. 25,640 ක් පත්වීම් ලිපියේ දක්වා තිබුණද බඳවා ගැනීමට අදාළ පුවත්පත් දැන්වීම අනුව තනතුරට අදාළ මූලික වැටුප රු. 38,530 ක් වූයෙන් එම වැටුප ගෙවන ලෙස මෙම නිලධාරියා ආයතනයෙන් ඉල්ලා තිබුණි. කෙසේ වුවද වැටුප නිවැරදි නොකිරීම මත එම ඉල්ලීම කම්කරු කොමසාරිස් ජනරාල් වෙත යොමු කිරීමෙන් පසු එහිදී දෙපාර්ශවය එකඟ වූ වැටුප් පරිමාණය හා හිඟ වැටුප්, තනතුර භාරගත් දින සිට නිවැරදි කරන ලෙසට උපදෙස් ලබා දී තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අදාල නිලධාරියාට එකතුව රු. 436,805 ක හිඟ වැටුප් ගෙවීමට අධිකාරියට සිදුවී තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඇ) ඉහත “ඇ” හි සඳහන් නිලධාරියාගේ සේවය ස්ථිර කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමට අධිකාරියේ උප සභාපතිවරයා විසින් 2015 සැප්තැම්බර් 17 දින එම නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොණුව සභාපතිවරයා වෙත ඉදිරිපත්කර තිබුණු අතර එහිදී එම ගොනුවේ පැවති කාර්යසාධන වාර්තාව ඉවත්කර වෙනත් කාර්යසාධන වාර්තාවක් අමුණා තිබූ බව සහකාර අධ්‍යක්ෂ මානව සම්පත්ගේ 2015 සැප්තැම්බර් 23 දිනැති සටහන මගින් අනාවරණය කරගෙන තිබුණි. එහෙත් ඊට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ඉ) ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 3.1 වගන්තිය ප්‍රකාරව ස්වකීය පත්වීමේ කොන්දේසි අනුව සේවයේ ස්ථිර කරනු ලැබීම පිණිස ලබාගත යුතු කිසියම් සුදුසුකමක් ලබා ගැනීම සඳහා මිස, පරිවාසය පිට සිටින නිලධාරියකු අධ්‍යයන හෝ අභ්‍යාස සඳහා පිටරට නොයැවිය යුතු වුවත් අධිකාරිය විසින් ඊට පටහැනිව නිලධාරීන් 18 දෙනෙකු විදේශ පුහුණු අධ්‍යයන වැඩසටහන් 2 ක් සඳහා යොමුකර තිබුණි.

(ඊ) 2016 අගෝස්තු 01 දින කාර්යාල කාර්ය සහායක තනතුරට බඳවාගත් නිලධාරියකු අධිකාරියේ සභාපති විසින් ඔහුගේ තනතුරට අදාල රාජකාරියෙන් පූර්ණකාලීනව නිදහස් කර අධිකාරියේ අරමුණුවලට පටහැනි විශේෂ කාර්යය පැවරුමක් ලෙස කළුතර දිස්ත්‍රික්කය තුළ අ.පො.ස (සාමාන්‍ය පෙළ) දක්වා අධ්‍යාපනය හදාරා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ තොරතුරු රැස්කිරීමට යොදවා තිබුණු අතර ඒ වෙනුවෙන් 2016 අගෝස්තු 01 සිට 2017 මැයි 30 දින දක්වා එකතුව රු. 348,973 ක දළ වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(උ) අධිකාරියට අදාල නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කර්මාන්ත නිපුණතා කවුන්සිල් (Sector council) 04 ක් ස්ථාපිත කිරීම සඳහා අදාල අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව සම්බන්ධීකාරක තනතුරක් ඇති කර එම තනතුර සඳහා 2016 මැයි 02 දින පුද්ගලයෙකු බඳවාගෙන ව්‍යාපෘති අරමුදල් මගින් වැටුප්, වාහන සහ ඉන්ධන දීමනා ලෙස 2016 වර්ෂය තුලදී එකතුව රු. 585,569 ක් ගෙවා තිබුණි. නිපුණතා කවුන්සිලවලට අදාලව පවත්වන සාකච්ඡා සම්බන්ධීකරණය හා සංවිධානය කිරීම මෙම නිලධාරියාගේ කාර්යභාරය විය. 2016 දෙසැම්බර් මාසයේදී දින10 ක්ද 2017 ජනවාරි සිට අප්‍රේල් දක්වා දින 26 ක්ද වශයෙන් දින 36 ක් පමණක් මෙම නිලධාරියා සේවය කර තිබුණු අතර ඒ වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් එකතුව රු. 420,200 ක් ගෙවා තිබුණි. ඒ අනුව වැඩ කරන එක් දිනකට රු. 11,672 ක් පමණ වූ අසාමාන්‍ය වැටුපක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

**4.9** වාහන උපයෝජනය

------------------------

2007 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා එන්ජිමේ අළුත්වැඩියාවක් සඳහා ධාවනයෙන් ඉවත්කර ඔරුගොඩවත්ත පරිශ්‍රයේ ගාල්කර තිබූ වාහනයකට අදාළ පැරණි ලිපිගොනුව විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා දෝෂය ඇතිවීමට හේතුවී තිබූ කරුණු හෙළිදරව් නොවුණි. මෙම වාහනය අළුත්වැඩියාව සඳහා 2011 වර්ෂයේ සිට වාර 4 කදී මිල ගණන් කැඳවා තිබූ නමුත් අළුත්වැඩියාව සිදුකර නොතිබුණි. 2011 වර්ෂයේ දී එය අළුත්වැඩියාව සඳහා ඉදිරිපත් වූ ඇස්තමේන්තුව රු. 918,428 ක් වූ අතර 2014 වර්ෂයේ දී එහි ඇස්තමේන්තුව රු. 1,683,500 ක් දක්වා වැඩි වී තිබුණි. 2014 වර්ෂයේදී අලුත්වැඩියා කරන ලද මෙම රථය 2016 මාර්තු 15 දින ගිනි ගැනීමකට ලක්ව තිබූ අතර 2016 ජූලි 21 දින රක්ෂණ සමාගම විසින් රු. 110,040 ක අත්තිකාරමක් ලබා දී තිබූ නමුත් 2017 නොවැම්බර් 23 දින වන විටත් එය නැවත අලුත්වැඩියා නොකර පෞද්ගලික ගරාජයක ගාල්කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 5.1 අභ්‍යන්තර විගණනය

---

අධිකාරිය විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නිලධාරීන් 08 දෙනෙකු අනුයුක්ත කර තිබුණද විගණන සැලැස්මට අනුකූලව විගණනයන් ක්‍රියාත්මක කිරීම,පසු විපරම් කටයුතු හා පෙන්වා දී තිබූ කරුණු නිවැරදි කිරීම යනාදී කරුණු කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනය පාලනය

---

සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම් සහ වියදම් හා තථ්‍ය ආදායම් සහ වියදම් අතර සියයට 10 සිට සියයට 118 දක්වා විචලතාවයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයෙන් අය විය යුතු, 2014 වර්ෂයේ දී ලෝක තරුණ සමුළුව සඳහා අධිකාරිය වැය කර තිබූ රු.2,000,000 ක මුදල ලැබිය යුතු ශේෂ යටතේ දක්වා නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේදී කටුබැද්ද ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ ශිෂ්‍ය නේවාසිකාගාරයේ සවිකර තිබූ අකුණු සන්නායක තඹ පටියේ අඩි 25 ක පමණ ප්‍රමාණයක් නැතිවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුයි.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) | ගබඩා පාලනය | මිලදී ගත් ඇතැම් ගබඩා ද්‍රව්‍ය පොත්වලට ඇතුලත් නොකිරීම |
| (ආ) | ගිණුම්කරණය | **(i)** ජර්නල් සටහන් යෙදීමේදී නිශ්චිත සීමාවන් පවරමින් නිළධාරීන්ට අධිකාරී බලය ලබා දී නොතිබීම.<br>**(ii)** ජංගම ගිණුම් 05 ක් සඳහා වෙන් වෙන් වශයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල නොකිරීම.<br>**(iii)** අධිකාරියේ වවුචර් අපිළිවෙලින් සහ අසම්පූර්ණව ගොනුගත කිරීම් සහ වගකිවයුතු නිලධාරියෙකුගේ පරීක්ෂාවකින් තොරව විගණනයට ඉදිරිපත් කිරීම.<br>**(iv)** එක් බැංකු ගිණුමක් සඳහා මුදල් පොත් 3 ක් භාවිතා කිරීම නිසා එම කටයුතු සංකීර්ණ හා අපහැදිලි වීම. |
| (ඇ) | වාහන උපයෝජනය | අවශ්‍ය අවස්ථාවලදී වාහන අළුත්වැඩියාවට යොමු නොකිරීම නිසා වාහන අබලන් තත්ත්වයට පත් වීම. |
| (ඈ) | කාර්ය මණ්ඩල කළමනාකරණය | **(i)** අධ්‍යයන කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් පරිදි බඳවා නොගැනීම නිසා පුහුණු කටයුතු සඳහා බාධා ඇතිවීම.<br>**(ii)** අනුමත බඳවා ගැනීමේ පරිපාටියට පරිබාහිර ක්‍රම මගින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.<br>**(iii)** රහස්‍යතාවය සහ ආරක්ෂාව සැපයෙන පරිදි පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම, විනය පරීක්ෂණ පැවැත්වීම හා එම තීරණ ක්‍රියාත්මක නොකිරීම. |
| (ඉ) | මුදල් කළමනාකරණය | විධිමත් අනුමැතියකින් තොරව සංචිත අරමුදල් පවත්වාගෙන යාමට ඉඩහැරීම නිසා මුදල් නිෂ්කාර්යව පැවතීම. |